**සීමා සහිත කන්තලේ සීනි කර්මාන්තායතනය - 2019**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමා සහිත කන්තලේ සීනි කර්මාන්තායතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කර්මාන්තායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කර්මාන්තායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කර්මාන්තායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කර්මාන්තායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කර්මාන්තායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කර්මාන්තායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කර්මාන්තායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කර්මාන්තායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කර්මාන්තායතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 හි 09 ඡේදය හා සමාගමේ ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාරව අවසන් තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ගණනය කර ගිණුම්ගත කළ යුතු වුවත් වසර 20 කට අධික කාලයක සිට පාවිච්චියට නොගෙන ගබඩාවේ පැවති රු.47,440,818 ක තොග ශේෂය වාර්ෂික තොග සමීක්ෂණයකින් හා ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමෙන් තොරව පිරිවැයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම මෙහි ඇතුළත් භාවිතයට ගත නොහැකි තොග ශේෂය සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් සිදු කර නොතිබුණු අතර ඒ තුළ රු.100,682 ක බැර ශේෂයක් ද ඇතුළත්ව තිබුණි. | කන්තලේ සීනි ආයතනය 1994.03.31 දින සේවකයින්ට වන්දි ලබා දී සේවයෙන් ඉවත් කරන ලදි. ආයතනයේ නිෂ්පාදන කටයුතු නොමැති බැවින් තොග භාවිතයක් නොවුණු අතර 1997 වර්ෂයේ පැමිණි සභාපතිවරයා විසින් සියලුම ගබඩාවල ගොඩනැගිලිවල සමීක්ෂණයක් සිදුකර ගබඩා සීල් තබා වසා දමන ලදි. ඉන්පසු වාර්ෂිකව තොග සමීක්ෂණයක් සිදු නොකල අතර යල් පැනගිය තොග සඳහා කපා හැරීමක් ද සිදු කර නොමැත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව තොග අගය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | වර්ෂ 25 ක් ඉක්මවූ එකතුව රු.9,701,467 ක විවිධ අත්තිකාරම් ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අයකර ගෙන නොතිබුණු අතර එම ශේෂ සනාථ කර ගැනීමට අවශ්‍ය සාක්ෂිද විගණනයට ඉදිරිපත් නොවීය. මෙම ශේෂයන් අයවීම අවිනිශ්චිත තත්ත්වයේ වුවද අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | 1994 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයන් වේ. මෙම ශේෂයන් පිළිබඳ විධිමත් තීරණ නොමැතිව අඛණ්ඩව ඉදිරියට ගෙන ඇත. මෙම ශේෂයන් සේවය අතහැර ගිය සේවකයින්ගේ අයවිය යුතු අත්තිකාරම් සහ උක් ඉඩම් කට්ටිකරුවන්ගෙන් අයකර ගතයුතු අත්තිකාරම වේ. මෙම ආයතනය වසා දැමීම නිසා අයකර ගැනීමට නොහැකි තත්ත්වයක පවතී. 1994 වර්ෂයේ සිට මේ දක්වා කිසිදු ණය මුදලක් හෝ | 1994 වර්ෂයට පෙර ලබාදුන් අයකර ගත නොහැකි අත්තිකාරම් පිළිබඳ විධිමත් ඇගයීමක් කර නිසි අනුමැතීන් මත පමණක් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අත්තිකාරම් මුදලක් නොගෙවූ අතර ගමන් වියදම් අත්තිකාරම් වශයෙන් ලබාගෙන පියවා නොමැත. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවිය යුතු රු.76,352,246 ක ශේෂයක් පැවති අතර වර්ෂ 10 කට වැඩි කාලයක සිට මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම පිළිවෙලින් රු.23,244,703 ක, රු.16,598,343 ක හා රු.23,293,031 ක නොපියවූ අත්තිකාරම්, රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට ගෙවිය යුතු ශේෂ හා සේවක අර්ථ සාධක, සේවක භාරකාර හා පාරිතෝෂික වෙනුවෙන් ගෙවිය යුතු ශේෂයන් පැවතියද එම ශේෂයන් සනාථ කර ගැනීමට සාක්ෂි සමඟ කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොවූ අතර ගෙවීම අවිනිශ්චිත තත්ත්වයේ වුවද අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු.76,352,246 ක් සම්බන්ධව නීතිපති උපදෙස් මත පැවති සාකච්ඡාවේදී රජයේ ආයතනයක් බැවින් අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් තීරණයකට එළඹිය යුතු බව දක්වා ඇත. රු.23,244,703 ක 1993 වර්ෂයට පෙර පැවති ශේෂයකි. 1993 වර්ෂයෙන් පසුව ප්‍රාදේශීය මිලදී ගැනීම් සිදු නොවුණි. රු.16,598,343 ක් කන්තලේ ආයතනය අබලි යකඩ නිකුත් කිරීමේදී එම ආයතනයෙන් ලබාගන්නා ලද වැඩිපුර මුදලකි. රු.20,330,623 දැනට සේවයේ සිටින සේවකයින් 34 දෙනාගේ සහ මියගිය සේවකියන් 03 දෙනා සඳහා ගෙවිය යුතු පාරිතෝෂික මුදල්ය. | ගෙවිය යුතු ශේෂයන් නිසි ලෙස ඇගයීම් කර නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ලැබිය යුතු හා පෙර ගෙවුම් ශේෂය තුළ වසර 25 කට පෙර සිට පැවති එකතුව රු.1,823,958 ක බැර ශේෂයක් පැවතියද එම ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය සනාථන විගණනයට ඉදිරිපත් නොවීය. | මෙම බැර ශේෂය 1994 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයන්ය. ඒ ශේෂ සම්බන්ධ සාක්ෂි ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන ආයතනයේ ලේඛනාගාරවල විනාශ වී ඇත. එම ගිණුම්වල බැර ශේෂ ඇති වීම ගිණුම් නිසි ලෙස පවත්වාගෙන නොයෑම මත සිදු වී ඇත. | ලැබිය යුතු ශේෂ නිසි ලෙස ඇගයීම් කර ගිණුම් නිවැරදි කළ යුතුය. |

### 1.5.2 කර්මාන්තායතනයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1957 වර්ෂයේදී ආරම්භ කරන ලද කන්තලේ සීනි කර්මාන්තායතනය වාර්ෂිකව සීනි මෙට්‍රික් ටොන් 16,320 ක්,මොලැසස් මෙට්ට්‍රික් ටොන් 9,000ක් හා පරිපාරක ස්ප්‍රීතු ලීටර් මිලියන 3.9ක නිෂ්පාදන ධාරිතාවයකින් යුක්ත විය. කර්මාන්තායතනයේ පරිපාලනයේ හා මෙහෙයුම්වල පැවති දැඩි අකාර්යක්ෂමතාවය හා අක්‍රමවත්භාවය වැනි | අදාළ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ලංකා රජය විසින් 2021.08.18 දින ආයතන 2 ක් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ ඇති අතර ඉදිරියේදී පරිපූරක ගිවිසුමකට එළඹීමට එකඟ වී ඇත. | විධිමත් ගිවිසුමක් මත කර්මාන්තායතනයේ කටයුතු ආරම්භ කිරීමට නොපමාව පියවර ගත යුතුය. |

කරුණු මත 1994 වර්ෂයේදී 1,133ක් වූ සියලු සේවකයන්ට පාරිතෝෂික ගෙවමින් සේවය අවසන් කර තිබුණු අතර එතැන් පටන් කිසිම නිෂ්පාදන කටයුත්තක් නොමැතිව කර්මාන්තායතනය වසා දමා තිබුණි. එසේම 2021 වර්ෂයේදී කර්මාන්තායතනයේ නිෂ්පාදන ඇරඹීමට පෞද්ගලික සමාගම් දෙකක් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹී තිබුණද මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වාම නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබීමෙන් මෙම කර්මාන්තායතනයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිතව පවතී.

**1.6 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 2023 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබුණේ 2023 පෙබරවාරි 01 දිනදීය. | අමාත්‍යාංශය විසින් මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර 2023.02.01 ඉදිරිපත් කර ඇත. මෙම ආයතනය නිෂ්පාදන කටයුතු නොමැතිව වසා දමා ඇත. | කර්මාන්තායතනයේ සේවකයින්ගේ සේවය අවසන් කළද විධිමත් පරිදි එහි වත්කම්, වගකීම් නිරවුල් කර ඇවර කිරීම සිදුකර නොමැති බැවින් චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම් සකස්කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 8.65 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.මිලියන 13.19 ක් විය. ඒ අනුව ඌණතාවය රු. මිලියන 4.54 කින් අඩු වී තිබුණු අතර පෙර වර්ෂයට සාපේක්ෂව භාණ්ඩාගාර ප්‍රදාන රු.මිලියන 6.28 කින් වැඩි වීම මෙම ඌණතාවය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| **විෂයය** | **වර්ෂය** | | **විචලනය** | **විචලනයේ ප්‍රතිශතය** |
|---|---|---|---|---|
| | **2019** | **2018** | | **සියයට** |
| | රු. | රු. | රු. | |
| **ආදායම්** | | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන | 10,701,472 | 4,419,695 | 6,281,777 | 142 |
| වෙනත් ආදායම් | 419,496 | 607,893 | 188,397 | 31 |
| **වියදම්** | | | | |
| පරිපාලන වියදම් | 19,762,322 | 18,217,602 | 1,544,720 | 8 |

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන් 0.61: 1 ක් හා 0.28 : 1 ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතයන් 0.63 : 1 ක් හා 0.29 : 1 ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1999 වර්ෂයේ සිට කර්මාන්තායතනයේ කිසිදු මෙහෙයුම් කාර්යයක් සිදු නොවුවද වත්කම් ආරක්ෂා කිරීම සහ පරිපාලන කටයුතු සඳහා පමණක් සාමාන්‍යාධිකාරි ඇතුළු අතීතයේදී වන්දි ලබා ඉවත් වූ සේවකයින් 34 දෙනෙකු වර්තමානයේද සේවය කරමින් සිටින අතර පසුගිය වර්ෂ 5 ක් තුළදී මෙම සේවකයින්ට වැටුප් හා වේතන, අතිකාල සහ අර්ථසාධක අරමුදල් ලෙස පිළිවෙලින් රු.61,369,907ක්, රු.9,409,962 ක් හා රු.5,650,470ක් ගෙවීම් කර තිබුණි. මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පාරිතෝෂික වගකීමද රු.20,881,623 ක් වී තිබුණි. | කළමනාකාරිත්වය අදහස් දක්වා නොමැත. | අනාර්ථික වියදම් සිදු නොවීමට අවශ්‍ය පියවර නොපමාව ගත යුතුය. |